ශ්‍රී ලංකා

දේශීය චිකිත්සා සංග්‍රහය

2018

ප්‍රථම භාගය

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයෙකි

1984

පුස්තකාලය
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය
යක්කල.

22. පරිච්ඡේදය

කාස චිකිත්සා

කැස්ස :

සඤ්ඤන්ත්‍ර රෝගයක් වශයෙනුත් විවිධ රෝගයන්ගේ ලක්ෂණයක් වශයෙන් මෙන් ම උපද්‍රවයක් වශයෙනුත්, කාස—කැස්ස ඇති වේ.මෙයින් සඤ්ඤන්ත්‍ර රෝගයක් ලෙස ඇති වන කාසය ප්‍රභේද පහෙකින් සහ ඒ ප්‍රභේද සඳහා ලියැවුණු චිකිත්සාවෙකින් ද යුක්ත ය. රෝග හේතූන් දැක්වීමේ දී හික්කා, ශ්වාස, කාස යන රෝගවලට හේතූන් සම බව දක්වා ඇත. එසේ ම ආශ්‍රිත ස්ථාන වශයෙන් ද සම වේ. එහෙත් රෝග සම්ප්‍රාප්ති වශයෙන් බලනවිට එකිනෙකට වෙන වෙන ම සම්ප්‍රාප්තියක් ඇත. එනමුත් හික්කා, ශ්වාස, කාසවල චිකිත්සා ද බොහෝ දුරට සමාන වේ.

කාස රෝගයක් විස්තර කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව පළමුව සලකා බැලීම යෝග්‍ය යැයි සිතිය හැකි ය:—

1. කැස්ස ප්‍රධාන ලක්ෂණය වශයෙන් බල පවත්වන රෝගයක් ද? එසේ නැති නම් කැස්ස අප්‍රධාන වශයෙන් බල පවත්වන රෝගයක් ද?
2. කැස්ස වේදනා සහිත ද? නැත් ද? හෙවත් කහින විට උරසේ හෝ උදරයේ හෝ වේදනා පවතී ද?
3. කැස්සේ දී ඇති වන ශබ්දය,
4. කැස්ස වියළි ද? ද්‍රව ගතියෙන් යුක්ත ද? හෙවත් කැස්සෙන් සෙම පිටවේ ද? නැත් ද?
5. පිටවෙන සෙම් කොටස්වල ගන්ධය, වර්ණය සහ වෙනත් දේ.

ඉහත සඳහන් කරුණු පිළිබඳ ව සලකා බැලීමේ දී කාස රෝගය නිශ්චය කර ගැනීමට විශාල සහනයක් ලැබෙනු ඇත. ඉහතින් සඳහන් කළ පරිදි සඤ්ඤන්ත්‍ර රෝගයක් වශයෙන් ඇතිවන කාසයේදී රෝගියාගේ ප්‍රධානතම වේදනාව (ලක්ෂණය) වනුයේ කැස්ස යි. පරතන්ත්‍ර අවස්ථාවල දී කැස්ස ප්‍රධානතම වේදනාව නොවනු ඇත.

කාස රෝග දැක්වීමේ දී ඒවා අභ්‍යන්තර හේතු සහ බාහිර හේතු යනුවෙන් කොටස් දෙකකට බෙද දැක්විය හැකි ය.

අභ්‍යන්තර හේතූන් වශයෙන් වේග අවරෝධය, විශේෂයෙන් කිවිසිලි වේග වැලැක්වීම, හෘද් රෝග, පෙණහලු වල ද්‍රව සංචය වී තිබීම, ශ්වාස නාල වියළීම, ක්‍රිමි රෝග හා වෙනත් ආමරෝග දැක්විය හැකි යි.

බාහිර හේතූන් වශයෙන් අධික ව දුම් හා ධූලි බැඳීම, අධික ව්‍යායාමය, රූක්ෂ ආහාරපාන නිතර ගැනීම හා ආහාර විමාර්ගගත වීම ද සඳහන් වේ.

මේ හැර එක් එක් ආචාර්‍යවරුන් එක් එක් කාස ප්‍රභේද අනුව වෙන වෙන ම හේතු ද දක්වා ඇත. තවදුරටත් හේතූන් සලකා බැලීමේ දී ප්‍රාණ අපාන වායු කුපිත වන හැම හේතුවකින් ම කැස්ස ඇතිවන බව කිව හැකි ය.

මෙම හේතූන් නිසා කාස රෝගය ඇතිවීමට නම් පහත සඳහන් ශාරීරික විකෘතීන් ද තිබිය යුතු ය.

කණ්ඨයෙහි හෝ උරසෙහි උත්පත්තියෙන් හෝ ඉන්පසු ඇති වූ විකෘති, පෙණහලුවල හා ශ්වාසනාලවල විකෘති ප්‍රාණවහ ස්‍රෝතස් විකෘති, කඵ සංචය වීම යන මේවායින් එකක් හෝ තිබිය යුතු යි.

පූර්වරූප :

මුඛය සහ උදර ප්‍රදේශ ශ්ලේෂ්මයෙන් ආවරණය කළා සේ දැනීම, උගුරේ කැසීම, ආහාර ගිලීමේ අපහසුකම යනා මේවා කාස පූර්වරූප යි.

රූප :

කැස්ස ප්‍රධානතම ලක්ෂණය වේ. කැස්සේ ආකාරය දීර්ඝ හ්‍රස්ව බව, වියළි බව, තෙත්බව, සෙම පිටවීම හෝ පිටවන සෙම ද්‍රවතාවෙන් ද කැට වශයෙන් ද යන මේවා ඒ ඒ ප්‍රභේද වලට අනුව වෙනස් වේ.

ලක්ෂණ :

කාසය ලක්ෂණයක් වශයෙන් පහත සඳහන් රෝගවල දී දැකිය හැකි යි. වාත කඵ ජ්වර, රක්තාශ්‍රිත ජ්වර, මජ්ජාගත ජ්වර, කඵ ප්‍රධාන සන්නිපාත ජ්වර, කඵජ ජ්වර, ගුල්ම, වාතෝදර, කඵෝදර, ප්ලීහෝදර, ජලෝදර, වාතෝල්බණ අර්ශස්, ශේලජ්මික ග්‍රහණි, තමක ශ්වාස, වාතජවිජර්දි, ශේලජ්මික විසර්ප, ග්‍රන්ථික විසර්ප, ආමාශයගත දුෂ්ට වාත, උරඃක්ෂත, රාජයක්ෂ්ම, කර්ණ ගූත්ථි, කර්ණ ශාලූක ආදිය යි.

ප්‍රභෙද:

වාතජ	පිත්තජ	කඵජ	ක්ෂතජ	ක්ෂයජ
හෘදය මජ්ජිෂ්ඨක පාර්ශ්ව ශූල මුහුණ වියළී කාන්ති හීනවීම බලය, සඤ්චරය සහ ඕජස ක්ෂීණ වේ කැස්ස වේග බහුල යි. වියළියි.	උරසේ දහය, මුඛයේ වියළීම, තික්ත රසය දැනීම, ජ්වර, පිපාසා, පාණ්ඩු, සර්වාංග දහ, කටුරස හා පීතවණී යුක්ත වමනය, මුළු ශරීරයේම දහය.	මුඛයේ සෙම ආලිප්ත වීම, ශරීරයෙහි ශීතල තාව, හිසරදය අරුචිය, උගුරේ කැසීම, සෙම කැටි ව හෝ යන ව පිට වීම	පළමුව ශුෂ්ක කාසය, රක්තයීවනය, තෘෂ්ණාව, උරස් ශූල, පාර්ශ්ව භෙද, ජ්වර, පිපාසා, ශ්වාස සඤ්චරභෙද, පර්ශ්වභෙද, කතිනවිට කපෝත කූජනය මෙන් ඇසීම	මුළු සිරුරම ශූල්ය. ජ්වරදහ, මෝහ, ක්ෂීණ මාංස, පූය සහිත රක්තය හෝ තනිකර රක්තය පිටවීම.

ක්ෂතජ කාස, උරඃක්ෂත හා සාහසරාජයක්ෂ්ම රෝගය යන අවස්ථා බොහෝ දුරට එක සමාන බැවින් එම රෝග අවස්ථා තුන එකිනෙකට වෙන් කර ගත යුතු යි. එම අවස්ථා තුන එකිනෙකින් වෙන් කර ගැනීමේ පහසුව සඳහා පහත සඳහන් රෝග විනිශ්චය උපකාර වෙනු ඇත:—

ක්ෂතජ කාස	සාහසරාජයක්ෂ්ම	උරඃක්ෂත
කාස	කාස	කාස
රක්තෂ්ඨීවන	රක්තෂ්ඨීවන	රක්තෂ්ඨීවන
සමාන නිදන	සමාන නිදන	සමාන නිදන
චිරකාරී	චිරකාරී	ආශුකාරී
රෝගියා දුර්වල ය	රෝගියා දුර්වල ය	රෝගියා බලවත් ය.
උරක්ෂත පිළිබඳ පූර්ව ඉතිහාසයක් ඇත.	උරඃක්ෂත පූර්ව ඉතිහාසයක් ඇත.	උරඃක්ෂත පිළිබඳ සමීප ඉතිහාස යක් ඇත.
කැස්ස වේදනාව ප්‍රධාන වේ.	යක්ෂ්මයට අයත් වෙනත් ලක්ෂණ ඇත.	උරඃශූලය හා රක්තෂ්ඨීවනය ප්‍රධාන රූපය වශයෙන් ඇත.

චිකිත්සා :

කාස රෝගය සඳහා පොදු චිකිත්සා ක්‍රමයක් සංහිතා ග්‍රන්ථයෙක හෝ වෙනත් ග්‍රන්ථයෙක සඳහන් නොවන අතර, වාතජ,පිත්තජ ආදි වශයෙන් ඇති ප්‍රභෙදවලට අනුකූල ව වෙන වෙන ම ප්‍රතිකාර විධි සහ චිකිත්සා දක්වා ඇත.

වාතජ කාස චිකිත්සා :

වාතජ කාස ඇති වන්නේ විශේෂයෙන් රූක්ෂ ශරීර ඇති අයට බැවින් එහිදී පළමුකොට ම රෝගියා අභ්‍යන්තර, බාහිර දෙවිධියෙන් ස්නේහනය කළ යුතු යි. අභ්‍යන්තර වශයෙන් වාතනාශක ද්‍රව්‍යවලින් සෑදූ ඝෘත වර්ග පානයට දීම. තෙල වස්ති යෙදීම ජේයා, යූෂ, ක්ෂීර හා මාංස රස දීම ද ස්නිග්ධ ධූම වර්ග හා අවලේහ වර්ග යෙදීම ද, බාහිර වශ යෙන් අභ්‍යංග, පරිෂේක වීයිවලින් ස්නිග්ධ කිරීම ද මැනැවි. යමාක් ස්නේහනයෙන් පසු ස්වේද කළ යුතු යි.

ඉහත සඳහන් පරිදි වස්ති චිකිත්සා කළ යුත්තේ මල ශුෂ්ක, එමෙන් ම කඨිනතායෙන් යුක්ත ව පිටවන රෝගි යාට පමණි. ඝෘත වර්ග අතුරෙන්;

කණ්ටකාරි ඝෘත, පිප්පල්‍යාදි ඝෘත, තුලෂණාදි ඝෘත, වාසාදි ඝෘත සහ රාස්නාදි ඝෘත වැදගත් වේ.

අවලේහ සඳහා :

විඩංගාදි චූර්ණය, ද්විත්‍රිකාරාදි චූර්ණය, ශුණ්ඨ්‍යාදි චූර්ණය, අපරාජිත ලේහය, ආර්ද්‍රකාව ලේහය, දුස්පර්ශාදි ලේහය, චිත්‍රකාදි ලේහය හෝ අගස්ති හරිතකී වැනි බෙහෙතක් යෙදිය හැකි ය.

ධූමය සඳහා :

මනඃශිලාදි ධූම, අර්කාදි ධූම, ප්‍රපෞණ්ඩරිකාද්‍ය ධූමවර්ති යන මේවා සුදුසු ය.

ඖෂධ වශයෙන් :

ලඝු මාලතී වසන්ත	නවරත්න කල්ක
සූතශේඛර	ශර්කරාදි කල්ක
රෞප්‍ය හස්ම	යෂ්ටී කල්ක
නාග හස්ම	චන්ද්‍ර කල්ක
බුද්ධරාජ කල්ක යන මේවා යෙදිය හැකිය.	

* කක්කල් කැස්ස ද වාතජ කාසයක් ලෙස සලකා පිළියම් කටයුතු යි.

පථ්‍ය :

ග්‍රාම්‍ය ආනූප ඵදක	මාංස රස	උඳු නිල් කම්පලා කප්කුම්මේරිය	ළපටි රාබු තලතෙල්
ශාලි		පෙත්තෝර	ඵක් යුස
යව		කිඹුල්වැන්න	දීපෙරළි දිය
ගෝධූම		කටුවැල්බටු	යන මේවා පථ්‍ය ය.
වසූරු මෑ		එළබටු	

පිත්තජ කාස චිකිත්සාව :

කඵානුබද්ධ පිත්තජ කාසයේ දී වමනකාරක ද්‍රව්‍යවලින් සෑදූ සෘත වලින් වමන කරවිය යුතු යි. නැත්නම් මදනඵල හෝ වැල්මී කෂාය කොට එයින් වමනය කරවිය යුතු යි. එසේත් නැත්නම් වැල්මී චූර්ණය හෝ කුකුරුමුවන් චූර්ණය විදාරීක්වාථය හෝ ඉක්ෂු රසය සමඟ යොදා වමනය කරවිය යුතු යි. මෙයින් දොස් පිට වූ පසු ශීතල මධුර ක්‍රම වලින් පහත දැක්වෙන පේයා විලේපි යෙදිය යුතු යි.

කේවල පිත්තජ හෝ කඵානුබන්ධය හෝ ඉතා අඩුවෙන් ඇතිවිට විරේචනය කළ යුතු යි. ඒ සඳහා ත්‍රිවෘත් චූර්ණය, සීනි හෝ මධුර වර්ග සමඟ සෙදිය යුතු යි.

ලේහ වශයෙන් :

ශර්කරාදි ලේහ,
ත්වගාදි ලේහය,
පිප්පලාදි ලේහ

යන මින් එකක් හෝ ගැළපෙන ද්‍රව්‍ය වලින් යොදගත් වෙන ලේහයක් හෝ යෙදිය යුතු යි.

සෙට දැඩිව ඇති නම්, තික්ත රස ද්‍රව්‍යවලින් සෑදූ ලේහ මධු සමඟ ද, සෙම බුරුල් ව ද්‍රවවක් ව ඇත් නම් ඔත්, මාංස රස සමඟ ද දිය හැකි ය.

සූතශේඛර රස රක්තිකා	04 යි,
කර්පූරාදි චූර්ණය මාෂක	01 යි.

යෝගය ඉතා හොඳ යි.

සාධාරණ ඖෂධ වර්ග :

අග්නි රස	හස්ම ශෘංගී
ආනන්ද භෛරව රස	වාසාදි චූර්ණ
ලෝකනාථ රස	කනකාසව
ත්‍රෛලෝක්‍ය චින්තාමණි රස	අෂ්ටාංගාව ලේහ
කඵ කුඨාර රස	ආර්ද්‍රකාව ලේහ
සටණ්ඩාංග	වසන්ත කුසුමාකර
මල්ල හස්ම	සටණ්ඩ ජීරක

පථ්‍ය :

(*i*) **සෙම සහ නම්,**

හැටදහාල් බත්	උක්සුස
සීනි දියකළ වතුර	එළකිරි
මුද්ගප්පලම් (රටම්දි)	

(*ii*) **සෙම දුව නම්,**

ජාංගල මාංස	තික්ත ශාක වර්ග
කොල්ඵ යූස	මීපැණි මිශ්‍ර ලේහ

කඵජ කාස චිකිත්සා :

වමනය :

කඵජ කාසයේ දී රෝගියා බලවතෙක් නම් පළමු කොට ම වමනය කරවිය යුතු යි. කඵක්ෂය සිදු කරන කටු, උෂ්ණ ආහාරපාන හා ඖෂධ වහි දිය යුතු යි. වමනය සඳහා අවශ්‍ය දේ යෙදිය යුතු යි.

වදක්ෂ :

1. ප්‍රුස්තර මූලාදි පානිය
2. කවිඵලාදි පානිය
3. දාර්වාදි ලේහ
4. පිප්පලාදි ලේහ
5. සෞවර්චලාදි චූර්ණ
6. දශමූලාදි ඝෘත
7. කණ්ටකාරි ඝෘත
8. කුලත්ථාදි ඝෘත යන මේවා අවස්ථාව අනුව යෙදිය යුතු ය.
9. රස සින්දූර රක්තිකා 02 යි
හර්ජිත ටංකණ රක්තිකා 01 යි } 3 යි.

මෙහි මාත්‍රාවක් දිනකට 03 වරක් මී පැණි සමඟ දීම ද ලාභදායක ය.

*පිත්තානුබන්ධ වූ විට උපද්‍රව රූපයෙන් තමකශ්වාසය ඇති විය හැකි යි.

ක්ෂතජ කාස :

මෙය අත්‍යන්ත හානිකාරක බව වටහා ගෙන ඉතා ඉක්මනින් ජීවනීය වර්ග, මධුර වර්ග වැනි බල මාංස වර්ධක දේ වලින් ප්‍රතීකාර කළ යුතු යි.

ක්ෂතජ කාස යනු උරඃක්ෂත අවස්ථාව යි. උරස් ප්‍රදේශයේ ක්ෂත ඇති වීමෙන් එය ඉතා ඉක්මනින් ක්ෂය රෝගය ඇති කරවයි. එම නිසා එයට පෙර ඉතා ඉක්මනින් බල මාංස වර්ධනය කරන මධුර ජීවනීය වර්ග ඇතුළත් බෙහෙත් වලින් චිකිත්සා කළ යුතු යි. මේ හැර **පිත්තජ කාස ප්‍රතිකාර** ද කළ හැකි යි.

* **ජීවනීය ගණ ඖෂධ**, මාංස රස ප්‍රයෝග, ඝෘත පාන, ධූමපාන ආදිය සඳහා වරකයේ එන විස්තර බලන්න.

ක්ෂයජ කාස :

ක්ෂයජ කාසයෙන් පීඩිත රෝගියාට දීපන, වෘංහණ, ස්නේහ ශෝධන, ඖෂධ ව්‍යත්‍යාසයෙන් යෙදිය යුතු යි. යම් ඖෂධයක් හෝ ආහාරයක් බලවර්ධක වේ ද? ඒ සියල්ල ක්ෂය කාසයෙහි හිතකර වෙයි.

සම්පූර්ණ ලක්ෂණ වලින් යුක්ත දුර්වල වූ ක්ෂය කාස රෝගියාට චිකිත්සා නොකළ යුතු යි. එහෙත් අල්ප ලක්ෂණ ඇති ශක්තිමත් රෝගියාට ප්‍රත්‍යාඛ්‍යානයෙන් ප්‍රතීකාර කළ යුතු යි.

මෘදු ශෝධන :

ඉහත සඳහන් පරිදි චිකිත්සා කළ යුතු යැයි තීරණය කරන ලද රෝගියාට මෘදු සංශෝධන යෙදිය යුතු යි. ඒ සඳහා ත්‍රිවෘත්, මිදියුෂ සමඟ හෝ ලෝධ්‍ර කෂාය සමඟ හෝ විදාරී සධරස සමඟ හෝ සාදගත් ගිතෙල් දිය යුතු යි. මෙම විරේචන ඉතා මෘදු ඒවා විය යුතු ය; ක්ෂයට විරේචන නිෂිද්ධ බැවිනි.

වාත ප්‍රධාන වුවහොත් :

ක්ෂයජ කාස පිඩින රෝගියාගේ ශරීරයෙහි පිත්ත, කඵ, ක්ෂීණ වී වායුව ප්‍රධානත්වයක් ගතහොත්, රස රක්තාදි ධාතු ක්ෂීණතාවයක් සිදුවිය හැකි යි. එහිදී කර්කටක ශ්‍රිංගී, බලා, මහාබලා, කිරි යන මේවා යොදා සාදගත් සෘත යෙදිය යුතු යි.

දිව්‍යාපංච මූලාදි සෘත
ගුඩුච්‍යාදි සෘත
කාස මර්දාදි සෘත

ද්‍රාක්ෂා දි ලේහ
පද්මකාදි ලේහ
ජීවන්ත්‍යාදි ලේහ
හරීතකී ලේහ

යන මේවා මෙහි යෙදිය යුතු සෘත ලේහ අතුරෙහි ප්‍රධානයෙන් ගැනේ.

* කැස්ස අධිකව පවතී නම්, ගම්මිරිස්, වූණිය ගිතෙල්, මීපැණි, සිනි සමඟ දිනකට තෙවරක් ද, වංග භස්ම හා හරිණ ශෘංග භස්ම, රක්තික 04 බැගින් ගෙන චූර්ණයෙන් තෝලා ½ සමඟ අනා දිනකට තෙවරක් ද දීම යහපති.

පථ්‍ය : ලාජා, ශාලි, ශෝධුම, මාෂ, මුද්ග, කුලත්ථ යූෂ, ලශුන, ද්‍රාක්ෂා, දාඩිම, එළකිරි, ජාංගල මාංස, උණුවකුර යනා මේවා පථ්‍ය වෙයි.

අපථ්‍ය : ස්නිග්ධ මධුර අන්න, විෂමාන්න, දධි, කිරි, ඇල්වකුර, ධූමපානා, දිවා සුප්තා, මෛථුන යන මේවා අපථ්‍ය වෙයි.

කාස විකිත්සා — පරිශිෂ්ටය

පටිච්ච :

කාස යනු ගමනාර්ථවත් කස් ධාතුවෙන් නිපන් කෘදන්තයෙකි. මේ රෝගයේ දී වාතය ශ්වාසයන්ත්‍රයේ සිට උඩට කසනය (ගමනය) කරන හෙයින් මෙයට කාස[1] යනු යෙදෙයි. කුත්සින ශබ්දාර්ථවත් කාස් ධාතුවෙන් ද කාස යනු නිපැදවිය හැකි ය. එය අනුව නරක (නින්දිත) හඬක් නිකුත්වන හෙයින් මෙයට කාස යනු යෙදෙයි යි කීමට ද එඩි දැන.

කාස — කැස්ස යනු එකක් ම ය. එනමුත් විභාර — වෙහෙර යන්නෙහි මෙන් දෙවන (තද්භව) ශබ්දය ඉටියට සමාන ව මෙන් ම වෙනස් ව ද විභාර වෙයි. කාසය, ශ්වාස යන්ත්‍රය ඇසුරු කළ ප්‍රතිශ්‍යාය හෝ නියා ඉදිමී යන ශ්වාස යන්ත්‍රය තුළ උපදනා සෙම් ආදි අපද්‍රව්‍යයන් පහ කිරීම උදෙසා දූෂිත ප්‍රාණවාතය උදානවාතයට අනුගත ව ක්‍රියා කිරීමේ දී ගෙවන් හිසේ කාස ක්‍රේන්දය[2] ප්‍රතික්ෂිප්ත (ප්‍රත්‍යාවෘත්ත) ආකාරයෙන් ක්‍රියා කිරීමේ දී[3] පැන නගින, කල් අල්ලන, බරපතළ රෝගයෙකි. කැස්ස පපුවේ නොහොත් උගුරේ සාමාන්‍ය කරුණෝපයෙන් උපදනා තාවකාලික පිඩාවකි. හේතු නිරෝධයෙන් පහ වන ක්ෂණික කැස්සක් ද ඇත. එයට පිළියමක් උවමනා නො වේ. හෙම්බිරිස්සාව මෙන් ම කැස්ස ද නොවැලඳුණු කෙනෙක් නැත. ඇසට දුම් වැදීම, කන්කුහරය කුරකින් ඇවිස්සීම, නාසා මාර්ගයෙන් ධූලි ආදිය පිවිසීම, උස්හඬින් කථා පැවැත්වීම යනාදිය කැස්සට හේතු වෙයි. බොරුවට ද කැස්ස පැවැත්විය හැකි ය. එසේ කිරීමෙන් කැස්ස උපදනා නැත තේරුම් ගත හැකි වෙයි. පොල් කෙන්දක් බදු යමක් නාසය තුළට යැවීමේ දී එය ඉවත් කිරීම සඳහා කිවිසීම් පැන නැගෙන්නාක් මෙන්, ශ්වාස යන්ත්‍රය තුළට දූම් ආදිය පිවිසීමේදී ඒවා ඉවත් කිරීම සඳහා කැස්සක් පැන නැගේ. එහෙත් කාසය එබන්දක් නො වේ. ප්‍රබල දෝෂ කෝපය ඇති එය කල් යෑමේ දී ක්ෂය රෝගයට ද හේතු වෙයි.

තවද —

විවාදේ ගෙය හාසය යි
රෝගයේ ගෙය කාසය යි.[4]

යනු කාසය ගැන උතුරු ඉන්දියානුවන් අතර පවතින කටකථාවකි. හැම ලෙඩකට ම කාසය සම්බන්ධවන බව මෙයින් ද කියැවේ. ශ්වසන ව්‍යූහගත සෑම රෝගයෙක ම ප්‍රධාන ලක්ෂණය කාසය යි. කාස හේතුව **බාහිර අභ්‍යන්තර** වශයෙන් දෙයාකාර ය.

නවීනයෝ 1. ශුෂ්ඛකාස, 2. ආර්ද්‍රකාස, 3. ආවේගිකාස, 4. රුක්ෂකාස, 5. ගව්‍ය කාස, 6. ශෝණිත කාස යන භේදය ද ඉදිරිපත් කෙරෙති.[5]

1. **ශුෂ්ඛකාසය** පැන නැගෙනුයේ ක්ලෝමනලිකාව තුළ තෙතගතිය සිඳියන අවස්ථාවල යි. ක්ලෝමනලිකා ප්‍රදාහයේ[6] මුල් අවස්ථාවේ දී මෙන් ම යක්ෂ්මයේ දී ද මේ තත්ත්වය ඇති විය හැකි ය. 2. **ආර්ද්‍රකාසයට** හේතුව **ක්ලෝමය** (ශ්වාසනලිකාව) තුළට සෙම්දියර ගලා රිම යි. පුරාණ ක්ලෝමනලිකා ප්‍රදාහය[7], ක්ලෝමනලිකා විස්ඵාරය,[8] ගත්වර (ක්ෂත)[9] හට ගැනීම යන මේවා හි දී මේ තත්ත්වය පැන නැගේ. කුක්කුරකාස[10], පුරාණ ක්ලෝමනලිකා ප්‍රදාහ වැනි රෝගවල දී මෙන් ම ක්ලෝමය තුළට බැහැරින් යමක් පිවිසී හිර වූ විට ද පැන නැගෙනුයේ 3. **ආවේගිකාසය** යි.නින්දට බාධා කිරීම මෙහි පිළිවෙළ යි. නින්දේ දී නාසිකා කුහරයේ පිටුපසේ කොට සින් කිලොමු නළය තුළට සෙම් දියර බේරියාමෙන් ද **නිදාගත්විට පමණක්** කැස්ස ඇති විය හැකි ය. පපුව තුළ ගෙඩි පිළිකා හෝ මහාධමනියේ ස්ඵීතිය[11] හෝ පැන නැගි ක්ලෝමය මතුපිට තෙරපීමේදී කාංසාපාතු ධ්වනිය බදු වැ උපදිනුයේ 4. **රුක්ෂකාසය** යි. පිළිකාවකින් සඩරයන්ත්‍රණ පරාවර්තිනී නාඩිය[12] පීඩා වීමේ දී රළු නොවූ ද බරහඬකින් (බැරෑණ් ගතියෙන්) යුක්ත වූ ද දික් දුඃශ්වසනය ඇත්තාවූ ද කැස්සක් පැන නැගේ. ගවයකුගේ කාස ශබ්දය හා සමාන වන මෙය 5. **ගව්‍යකාස** නමින් හැඳින්වේ. **පාරාවත කාස** යනු දූ මෙයට ම නමි. කඹින විට ලේ නික්මීම 6. ශෝණිත කාසයේ[13] සඩරූපය යි. මේවා පිළිබඳ තොරතුරු ආලොපැනි නිදාන ග්‍රන්ථයෙන් බලා දැන ගන්නේ ය.

---

[1] කසතීති **කාසඃ**; කසති ගිරඃ — කණ්ඨ්‍යාදූර්ද්ධවං ගච්ඡති — වායුරිති කාසඃ. [2] Cough Centre.

[3] Reflex Action; ප්‍රාණවායුව ආශ්වාසය ද, උදන (උරඃර්ද්ධවග) වායුව නිඃශ්වාසය ද පවත්වයි. කාසයේ දී මේ වායු දෙක ම නිඃශ්වාසයට සහභාගි වෙයි; අපද්‍රව්‍යාපහරණය සඳහා ය.

[4] කඩග්ඩෙ කා සර් බාංසි — ඔර් — රෝග් කා සර් බාංසී, (ගීත්දි)
කඩග්ඩා —විවාදය — වාක් සංග්‍රාමය.

[5]* ශුෂ්ඛකාසය Dry Cough ආර්ද්‍රකාසය — Loose Cough.
ආවේගි කාසය — Pavoxiamal Cough. රුක්ෂකාසය — Brassy Cough.
ගව්‍යකාසය — Bovine Cough. ශෝණිත කාසය — Haemoptysis.

[6] ක්ලෝමනලිකා ප්‍රදාහය — Bronchitis. [7] Chronic Bronchitis. [8] Bronchiectasis.

[9] ගත්වර — ගවහරු; ක්ෂත — කුන්තු — Cavities. [10] Whooping Cough. [11] Aneurysm.

[12] Recurrent Laryngeal Nerve. [13] හීමොප්ටිසිස්.

ක්ෂය, කාස, හික්කා, ශ්වාස යන රෝග සතර ම බෙහෙවින් සමාන හේතූන් උඩ ම පැන නැඟේ. අධිෂ්ඨානය ද එක ම යැ, එනම් ශ්වසන සංස්ථානය යි. මේ සතරින් හික්කා ශ්වාස දෙක පහසුවෙන් වෙන් කැර ගත හැකි වෙයි; හික්කාවෙහි ඉක්කාවත් ශ්වාසයෙහි හතියක් නොහොත් තමකශ්වාසයෙහි නළාහඬ සහිත හතියත් ඇති බැවිනි. ක්ෂය කාස දෙක්හි සමානතා මෙන් ම අසමානතා ද ඇත. එහෙයින් ඒ දෙක වෙන්කැර ගැනීම කරමක් අපහසු වෙයි. කාලයක් තිස්සේ නිතර කහින කෙට්ටු රෝගියාට ඇත්තේ ක්ෂය ද? කාසය ද යනු සිතට කරදරකාරී ප්‍රශ්න දෙකකි. හවසට සිරුරේ උෂ්ණත්වයේ සුළු වෙනසක් — වැඩිකමක් ඇද්දැයි සෙවීමත්, නවීන පරීක්ෂණ විධි පිළිබඳ සහායකවය ලබා ගැනීමත් මේ දෙක විසඳා ගැනීමේ මාර්ග දෙක යි. මේ රෝගය ක්ෂය නො වේ නම් කාසය යි.

චිකිත්සා උපදේශ :

1. කාසය ශ්වාසයන්ත්‍රයේ අපද්‍රව්‍යාපහරණය පිළිබඳ ශාරීරික ප්‍රයත්නයෙකි. මෙහි ලා සාමාන්‍යයෙන් **මධුර, ක්ෂාරිය**, කටුක, උෂ්ණ යන පදාර්ථයන්ගේ ප්‍රයෝගය හිතකර වෙයි. **මධුරපදාර්ථයන් අතුරින්** සීනි, පුරාණ ගුඩ, වැල්මී, මීපැණි යන මේවා ද, **ක්ෂාරිය පදාර්ථයන් අතුරින්** යවකර, නවසාරම්, පුස්කරපොරි යන මේවා ද, **කටුක පදාර්ථයන්** අතුරින් ඉහුරු හෝ අමුඉහුරු, මිරිස්, තිප්පිලි යන මේවාද, **උෂ්ණ පදාර්ථයන් අතුරින්** උණුවතුර, සුදුලූනු, රතුලූනු යන මේවා ද මෙහි ලා උපයෝගී වෙයි. හැම කටුක වර්ගයක් ම උෂ්ණ ය. රතු (කරල්) මිරිස ද කටුක වර්ගයට අයත් වෙයි. එහෙත් එය මෙහිලා හානිකාරක ය. අලුත් මීපැණි ශීත වීර්‍යයෙන් ද, පරණ (අවුරුද්දක් ඉක්මැවූ) මීපැණි උෂ්ණ වීර්‍යයෙන් ද යුක්ත ය. එහෙයින් **ආර්ද්‍රකාසයේ** දී පරණ මීපැණි ද, **ශුෂ්ක කාසයේ** දී අලුත් මීපැණි ද යෙදීම මනා වෙයි.

පිත්තජ කාසයේ දී මෘදුක්ෂාරවර්ග මෙන් ම ඉහුරු තිප්පිලි වැනි සැර අඩු කටුක වර්ග ද යෙදිය හැකි නමුත් ඒවා නො යොදූ මධුර ද්‍රව්‍යවලින් ම ක්‍රියා කළ හැකි නම් වඩා හොඳ ය. පිත්තජකාසයේ දී ලෙය පහ විය හැකි බව ද මතක තබා ගත යුතු ය.

2. හැම කාසයෙක්හි දී ම බීම් නැම් ආදියෙහි ලා උෂ්ණෝදක ප්‍රයෝගය ප්‍රශස්ත ය. උෂ්ණෝදකය වාත කඵ පීඩා යන මේවා මෙන් ම ප්‍රතිදෝෂ හා කෘමිදෝෂ ද මැඩ හෙළයි.

3. සෙම කැඩී වෙන් වී නො එන විට ස්නිග්ධ තික්ෂ්ණ ද්‍රව්‍යයන් යොදූ පිළියෙළ කැර ගත් ආලේපයක් මඳක් රත්කැර පපුවේ ගැම්ම මැනවි. ඒ සඳහා පරණ ගිතෙල්, අබතෙල්, ඊඉටි යන කුන් වර්ග සම සම ව ගෙන රත් කැර පිළියෙළ කැර ගත් ආලේපය ද යොදූ ගත හැකි ය.

මේ සඳහා සුදුසු බෙහෙතක් තෙලක් යොදූ ගැනීම ද හොඳ ය. මෙසේ කිරීමේ දී පපුවේ සෙම බුරුල් වී කැස්ස එළියට ඇදී එයි. තෙල් ආලේප කිරීමට අනතුරු ව බුලත්කොළ හෝ එවැනි වෙන කොළ වර්ගයක් හෝ පපුවේ තබා, ඊට උඩින් පුළුන් හෝ ප්ලැනැල් රෙදි කඩක් හෝ තබා බැඳ තැබීම ද ලාභයට හේතු වෙයි. ආලේපවලට කපුරු ටිකක් ද ඉතා සුළු ප්‍රමාණයක් සවිඳ ලුණු ද මිශ්‍ර කිරීම අධික ගුණලාභයකට හේතු වනු ඇත. සවිඳලුණු වැඩි වීම හමට හොඳ නැති බව මතක තබා ගත යුතු ය. අබින් හා කොකුම් මල් ඇල් වතුරින් අඹරා රත් කොට පපුවේ ගැමෙන් පපුවේ පීඩා ව සන්සිඳේ.

4. නරක් වූ උකු සෙම වැඩි වැඩියෙන් නික්මෙද්දීත් කැස්ස අඩු නොවී පවත්නා විට, සෙම වැඩීමට ඉඩ නොලැබෙන සේ ක්‍රියා කළ යුතු ය. සිතෝපලාදි චූර්ණය මෙන් ම රාජයක්ෂ්මය පිළිබඳ බෙහෙත් වලින් ගැළපෙන දේ ද ගෙන මෙහි ලා ප්‍රයෝග කිරීම මැනවි. තාලීශාදි චූර්ණය, සරුවත් වර්ග, ළෝලු ගෙඩි ආදිය අත් හළ යුතු ය.

5. පපුවේ පීඩාව ඇත හොත් එය මැඩ හෙළීමට පසුබට නොවීම මැනවි. අංක 3 දරන ඡේදයෙහි ආ වැඩ පිළිවෙළ එහි ලා ඵලදායක වනු ඇත. මුවඅං ඇල්දියෙන් ගලගා, වතුරට දමා, උණුකැර බීමට දීම ද ප්‍රයෝජනවත් ය. අලුත් ගිතෙල් සෙම්ලෙඩට අගුණ වුව ද, පරණ ගිතෙල් විශිෂ්ට ගුණදායී ඒකීය ඖෂධයකි. මුව අං අළු (මෘගශෘංග භස්මය) ග්‍රෑ 2 — 4 මාත්‍රාවෙන් ගෙන තනිකර ම හෝ වෙනත් බෙහෙතකට මිශ්‍ර කර හෝ දීම ප්‍රශස්ත ය. මේ භස්මය මඳක් ගිනියම් ය. එහෙයින් ලේ යන අවස්ථාහි දී නොදිය යුතු ය. පුෂ්කරමූල චූර්ණය ග්‍රෑ 4 බැගින් ගෙන, සිඩතන්ත්‍ර අයුරින් හෝ වෙනත් බෙහෙතකට මිශ්‍ර කර හෝ දීම මෙන් ම දසමුල් කසාය දීම ද ලාභදායක ය.

6. රාජයක්ෂ්ම උරඃක්ෂත දෙක්ගි දී ම පෙණහැලිවල ක්ෂත (කුත්තු) ඇති වේ. එවිට ඉක්මනින් කැස්ස නතර කිරීම ගැනත්, රෝගියාට අධිකතම විශ්‍රාමයක් දීම ගැනත් නොදීන් සළකා බැලිය යුතු ය. ප්‍රාණායාමය හොඳ නැත. පිරිසිදු වාතය අවශ්‍ය ය. මී ගිතෙල් සංයෝගය දෝෂනත්වානුරූප ව සවනන්තු ව මෙන් ම අනුපාන විසින් ද යෙදීම මැනවි. පෙණහැලි දෙකටත්, වණ, (ගිදෑස්) වලටත් උණකපුරු ඉතා හොඳ ය. එමතු නො වේ; නරක් වූ සෙම ප්‍රකෘතියට පත් කිරීමේ හැකියාව ද උණකපුරට ඇත. එහෙයින් එය සවනන්තු අයුරින් මෙන් ම සිතෝපලාදි චූණයට හෝ තාලීශාදි චූණයට හෝ වෙනත් බෙහෙතකට හෝ සැහෙන ගැළපෙන මාත්‍රාවෙකින් මිශ්‍ර කර දීම යෙහෙකි.

7. මලබද්ධයට ඉඩ නොතැබිය යුතු ය. දිනපතා ම පිරිසිදු ව සිටීමට රෝගියාට උපදෙස් දීම මැනවි. ලේ නික්මීමක් නැත් නම් වමනයෙන් සෙම ඉවත් කිරීම අතිශයින් ම ප්‍රයෝජනවත් ය.

8. චිකිත්සාව ඇරඹීමට පෙර උගුරේ ඇතුළත යෝදිසි කැර, ගලගුඩිකාව (රහදිව) මහත් ව තිබේ නම්, දකුණු අතේ මැද ඇඟිල්ලෙන් පුස්කර අඳ ටිකක් ගෙන එහි අතුල්ලා උඩු අතට පිරිමැදිය යුතු යි. එවිට කටික් හෝ නාසයෙන් ලෙය අව හොත් එය සුබ ලකුණකි. එසේ වීමේ හේතුව රහදිව පිපිරී යෑම යි.

උගුරේ (රහදිවේ) දෙපසෙහි ගලග්‍රන්ථි දෙකෙකි. සඬසථ අවසථාවේ බෙහෙවින් ගිලි පවත්නා ඒ දෙක රුග්ණ අවසථාවේ පොකුහළ පුවක්ගෙඩි දෙකක ප්‍රමාණයෙන් ඉස්මතු වී පෙනෙනු ඇත. එවිට පුස්කර අඳ හා සිනකර අඳ හා දෙවඟිය මීපැණියෙන් අතා වරින් වර ඒ දෙකෙහි ගෑ යුතු ය. උණු වතුරට ලුණුත් සිනකරත් පිටි කැර දමා සොල වමින් වරින් වර කවලග්‍රහ විසින් මුඛ ප්‍රක්ෂාලනයෙහි යෙදවීම මැනවි. වෙනත් ආලේප බෙහෙත් වහි ද මෙහි ලා ප්‍රයෝග කළ හැකි ය. උගුර පිරිසිදු කිරීමේ පරමාර්ථය වනාහි ගලග්‍රන්ථියේ විස සෙම ඉවත් කිරීම යි. ග්‍රන්ථිය (සෙම ගෙඩි) පිපිරී ගියාට පසු ලුණු වහි ඇතුළත් බෙහෙත් යෙදීම නොවනා ය.

සෙම බුරුල් කිරීමට මෙන් ම බැහැර කිරීමට ද වැල්මී වතුර, සිහි වහි, සරුවත්, ගුඩ (හකුරු) වහි, අලුත් මී පැණි, රතුලූනු ඉස්ම, සේහුංඩ කොළ ඉස්ම, අමු ඉහුරු ඉස්ම යන මෙවා අනුපාන විසින් යෙදිය හැකි ය. පාවටටා, කටු වැල්බටු, බුලත්, සුදුලූනු, කකුළු සුං යන මෙවා අනුපාන විසින් ප්‍රයෝග කිරීමේ දී සෙම කෝපය අඩුවී යනු ඇත. කවර අවසථාවක දී වුව ද ගැළපෙන අනුපානය නො ලැබේ නම් ඒ සඳහා උණුවතුර යෙදීම යහපත් ය.

චිකිත්සා

උපේක්ෂිත කාසයත් ක්ෂයත්වයට හැරෙන බව පෙරත් කියවී ඇත. කාස — ක්ෂය සම්බන්ධය මේ අනුව සිතාගත හැකි ය. ක්ෂයට නියමිත ක්වාථාදි බොහෝ දෙය කාසයටත් යෙදිය හැකි බව ද මේ අනුව විනිශ්චය වෙයි. ඒ හෙයින් ඒ ගැන ද සළකා බැලිය යුතු ය.

වාතකාස චිකිත්සා :

කාශතාව වාතකාස හේතුවකි. වාතකාසය කාශතා හේතුවකි. මේ අනුව වාතකාසයට ශරීරශක්ති කාරක අනනපානාදිය යෙදීම ගැන පළමු ව සළකා බැලිය යුතු ය.

පථ්‍ය :

හැල්, සැටදහැල්, යව (බාර්ලි), තිරිඟු යන මේවායින් ගැළපෙන දෙයක් ප්‍රධාන ආහාරය වශයෙන් තෝරා ගෙන තම්පලා වහි, කළුකැමෙරිය, රාබු, ඇඹුල් ඇඹිලිය, තලතෙල් ආදි ස්නිග්ධ ද්‍රව්‍ය, ක්ෂීරවිකෘති (කිරි යොදා සාදා ගනු ලබන කැම), ඉක්ඛුවිකෘති, ගුඩවිකෘති, දිකිරි, කාඩි, ඇඹුල්, පලතුරු, සුරාසාර, මධුරද්‍රව්‍ය, අම්ල ද්‍රව්‍ය, ලවණ ද්‍රව්‍ය, ග්‍රාම්‍ය මාංසරස, අනූපමාංසරස, ජලජ මාංසරස, උදු සුප්, වඳුරු මැ සුප් යන මේවායින් ලබාගත හැකි දේවල් සමඟ කෑමට දිය යුතු ය.

පංචමූලි ක්වාථය :

පංචමූලිකෘතඃ ක්වාථඃ — පිප්පලීචූර්ණ සංයුතඃ,
රසාන්නමශ්නතෝ නිත්‍යං — වාතකාසමුදස්‍යති;

මස් හොදි සමඟ බත් කමින්, තිප්පිලි පිටි යෙදූ මහපහ කසාය බීමෙන් වාත කාසය සුව වන බව මෙයින් පැවසේ. වාතයේ රුක්ෂ ගුණයට පටහැනි ස්නිග්ධ ගුණය මස් හොද්දෙන් ද, කාසයේ ශුෂ්ක කඵය ආර්ද්‍රතාවට පත් කිරීමේ බලය තිප්පිලි පිටියෙන් ද, වාතයේ ශීතවීර්‍යය හා පීඩා කාරකත්වය ඉහා කිරීමේ බලය මහපස් මුලින් ද ලැබෙන හෙයින් මේ **මහපහ කසාය** වාතකාසයෙහි අතිශයින් ම ප්‍රශස්තය යි කිය යුතු ය. මෙය **කිරි කසාය** වශයෙන් යෙදීම මෙන් ම කාසය බොන අතර ම කිරි දීම ද ගුණදායක වෙයි. කිරෙන් වියළි සෙම උත්ක්ලේශඛයට පැමිණ බුරුල් වන හෙයිනි. මෙහි පස්මූල වශයෙන් සුඵපහ ගැනීම ද ඇතැම් වෛද්‍යවරුනට අභිමත ය.

දශමූලි ක්වාථය :

දශමූලි වෘෂ ද්‍රාක්ෂා — ක්වාථෝ මාගධිකාන්විතඃ,
වාත කෝප සමුද්භූතං — කාසං හරති දාරුණම්;

ගුණ්ඩාදි ක්වාථය :

ගුංඩ්‍යාඃ සමාහරේත් නිෂ්කං — තත්සමං ගදනාමිකම්[1],
වාමාපිඩා[2]සුමේහාශ්ව — ෂණ්ණිෂ්කං සමුපාර්ජයේත්;
ගින්නාලශර්කරා චාත්‍ර — චතුර්නිෂෙකෝ භවෙද් ගුඩඃ,
කඵාය ඵිඵා සංශස්තඃ — කාසේ ශුෂ්කඛමාගතේ;

අපරාජිත ලේහය :

ශටිශෘංගිකණාහාර්ංගී — ගුඩචාරිදයාසකෛඃ,
සතෛලෛර් වාතකාසග්නෝ — ලේහෝ'යමපරාජිතඃ;

භාර්ඩගාදි ලේහය :

භාර්ංගි ද්‍රාක්ෂා ශටි ශෘංගී — පිප්පලි විඞඟභෂජෛඃ,
ගුඩතෛල යුතෝ ලේහෝ — ගිතෝ මාරුතකාසිනාම්;

ස්නේහය හා ස්වේදය :

ශ්වාසනලිකා වියළි, පටු වී, ගෝරෝසු වී ගියවිට ශ්වාස ක්‍රියාවට බාධා පැමිණේ. එසේ කාලයක් තිබීමේ දී වායු වක්ෂස් තත්ත්වය පැහ නැහේ. රෝගියා බාහිර අභ්‍යන්තර දෙවිසියෙන් ම ස්නිග්ධ කොට, ස්වේදනය කළ යුතු ය. ඒ සඳහා මී ගිතෙල් පොවා, වාතහර තෙලයක් පපුවේ ගල්වා, නික, පාවට්ටා ආදිය ඇතුළත් පෙට්ටනියෙකින් නැවිම මැනැවි.

අන්තඃස්නේහනය සඳහා නියමිත තෙල් සහිත ලේහ වර්ග ද යෙදිය හැකි ය. කාසයේ දී ගිතෙල අගුණ වනුයේ කඵකෝපය ඇති අයට යි.

පපුවේ වියළීම. ඇති විට දළු අනුපානයෙකින් බුද්ධරාජ කල්කය ද, බුලත් යුසින් ලක්ෂ්මිවිලාසය ද යෙදිය හැකි ය. උණුඅළුවෙන් දෙගි ගෙඩියක් තම්බා ඉස්ම ගෙන මිපැණි සමඟ විටින් විට පෙවීම ද මැනවි.

අරිෂ්ට :

දශමූලාරිෂ්ටය හා ද්‍රාක්ෂාරිෂ්ටය වෙන වෙන ම මෙන් ම මිශ්‍ර කොට ද යෙදිය හැකි ය. දශමූලාරිෂ්ටය හෘදය බලකාරකයෙකි.

සෙම අද්දන පැණිය :

සුඵපහ කසාය චතුර	කර්ෂ 26 යි.
දළුක් (ඡේහුංඩ) කොළ යුස	කර්ෂ 16 යි.
රතුලූනු යුස	කර්ෂ 16 යි.
අමු ඉතුරු යුස	කර්ෂ 08 යි.
තල් සුකිරි හෝ සිනි	කර්ෂ 26 යි.
ගුඩ	සේරු 01 යි.

මේ සියල්ල බඳුනෙක බහා කකාරා පැණිය (ලාශනිය) පිළියෙල කරනු. මෙයට ලෝලුසිරප් හෝ වාසක සිරප් හෝ කර්ෂ 16 ක් මිශ්‍ර කළ හොත් වඩා හොඳ ය. මෙය කඵනිෂ්කාගනය අරමුණු කොට අනුපාන සඞරූපයෙන් මෙන් ම සඞතන්ත්‍ර ව ද, උචිත මාත්‍රාවෙන් වරින් වර ප්‍රයෝග කිරීම විශිෂ්ට ලාභයකට හේතු වෙයි. දළුක් කොළ ඉස්ම රේවක ය එහෙයින් දවසකට දෙවරකට වඩා බඩ යන අයට මෙය නොදිය යුතු ය.

---

[1] ගදඃ — කොට්ටම්. [2] වාමාපිඩා — වංඋපල.

කර්නිෂ්කාෂ්ඨ චූර්ණය :

කාලීයාදි චූර්ණය	මාෂක	06 යි.	මේ සියල්ල එකට මිශ්‍ර කරනු.
වැල්මී චූර්ණය	මාෂක	03 යි.	
පුස්කර පොරි පිටි	මාෂක	01 යි.	
ප්‍රවාලභස්ම	ගුංජා	04 යි.	
මුවඅං අළු	ගුංජා	04 යි.	

මේ එක දවසකට ගැළපෙන ප්‍රමාණය යි. මෙය ඉහත කී සෙම අද්දන පැණියේ මේස හැදි දෙකකට කලවම් කැර, කැස්ස එන විට තේ හැදි 01 බැගින් ගෙන ලේහ කිරීමට දිය යුතු ය. සෙම බුරුල් වී නික්මී (කැගි කැඩී) යන්නේ නම් කැස්ස සන්සිඳෙනු ඇත. මෙය මෙහි ලා යුනානි වෛද්‍ය ක්‍රමයෙහි දැක්වෙන **ලැක් සෂිෂ්ටා** නමැති ඖෂධයේ ගුණයට සමාන වන ගුණයක් දක්වන්නේ ය.

බර්ජූරාදි අවලේහය :

බර්ජූරමේකනිෂ්කං සාර්ද්ධ — ද්විනිෂ්කා මධුයෂ්ටිකා,
මාධ්වීකං කුඩවං වේක්ෂු — ඒණිතං මාණිකා ගවේක්;
ජම්බීර සාරසෝ බිල්වඃ — සර්ං සංක්වාථයේදනඃ,
ලේහයේච්ඡුෂ්කකාසය්නු — ශීඝ්‍රමේව විපද්‍යතේ;

*සෙම බුරුල් කිරීම සඳහා තල් සූකිරි, සිනි, වැල්මී, වියළි රටමිදි, රබඹේ සුස් (යූනානි) යනාදිය හා මරිවාදිවටි, ලවංගාදිවටි යනාදිය ද ඉතා හොඳ ය. මෙවා කැස්ස සන්සිඳවීමෙහි ද ඉවහල් වෙයි.

*ප්‍රංඛාමාන රසය ගුංජා දෙක බැගින් බුළුකුඩු මීපැණි යන දෙවර්ගය සමඟ දවසට දෙවරක් දීම ද, වාතකාස, ප්‍රශමනයෙහි ඉවහල් වෙයි.

පිත්තකාස චිකිත්සා :

මෙහි දී හැම යෝගයකට ම පිත්ත ප්‍රශමන ද්‍රව්‍යයන් ද ඇතුළත් කළ හොත් මැනවි. පිත්තකාසයේ දී මධුර ද්‍රව්‍යයන් සමඟ ද, උකුසෙම සහිත පිත්තකාසයේ දී තික්ත ද්‍රව්‍යයන් සමඟ ද, විරේචනය අරමුණු කොට උචිත මාත්‍රාවෙකින් තිරස්සවාලු යෙදිය යුතු ය.

ත්‍රිවෘද්ධාක්ෂාභයාදිය මෙන් ම **වාසාද්‍යාක්ෂාභයාදිය** ද මෙහි ලා අපේක්ෂිත අනුලෝමනය සිදු කරනු ඇත. කැස්ස හා උගුරේ ආබාධ ඇති අවස්ථාවල අරළු ඉතා හොඳින් ක්‍රියා කරයි. අරළුවල කෂාය රසය උගුරට හිතවත් ය. **වාසාවල නිර්යාස** පදාර්ථය චූර්ණරෝපණයට අදළ වෙයි.

වාසායාඃ සාරසඃ පූතඃ — කණාමාක්ෂික සංයුතඃ,
පිත්තශ්ලේෂ්ම කාතේ කාසේ — රක්ත පිත්තේ ච ශස්‍යතේ;

වාසාසාරසයට තිප්පිලි පිටි හා මීපැණි මිශ්‍ර කැර දීම ද, පින් සෙම කැස්සෙහිලා ලාභදායක ය. මෙය රක්පිතට ද ගුණ කාරක වෙයි. වාසාවල ස්වින්න සාරසයට වඩා පුටපක්ව සාරසය ගුණයෙන් උසස් ය. මෙය මාස කීපයක් ම නොකඩවා දීමේ දී දුස්සාධ්‍ය කාස රෝගය ද විනීත වනු ඇත. තාලීසාදි චූර්ණය සමඟ දීම වඩාත් ප්‍රයෝජනවත් ය.

බලාදික්වාථය :

බලාද්විවෘහතීවාසා — ද්‍රාක්ෂාභිඃ ත්වථිතං ජලම්,
පිත්තකාසාපහං ජේයං — ශර්කරාමධු යෝජිතම්;

සිංහානනාදි ක්වාථය :

සිංහානනා'මෘතා සිංහී — ක්වාථං මාක්ෂික සංයුතම්,
පිබේත් සපිත්තකඵජේ — කාසේ ශ්වාසේ ක්ෂයේ ජ්වරේ;

ක්ෂීරක්වාථය :

ශරාදිපංචමූලස්‍ය — පිප්පලි ද්‍රාක්ෂයෝස්තථා,
කෂායේණ ශෘතංක්ෂීරං — පිබේත් සම්ධුශර්කරම්;
කාසඃ ශාම්‍යති පිත්තෝත්ථඃ — ශුෂ්කං විද්‍රාවයත් කඵම්.

පිප්පලාදි ක්වාථය :

පිප්පලිවෘෂචිහිතකෛෂධං — ඛන්ඩියාස සහිතං ශෘතං පයඃ,
පිත්තකාස විසමජ්වරං ජයේජ් — ජාතිදුඃඛමිව සෙවගතාගමඃ;

අවලේහ :

වාසාවලේහය හා සමශර්කර ලේහය ද
මෙහි ලා ගුණකාරක වෙයි. එසේ මැ —

ද්‍රාක්ෂාදි ලේහය :

ද්‍රාක්ෂාමලක බර්ජූරං — පිප්පලිමරිචාන්විතම්,
පිත්තකාසාපහං හෙතල් — ලිහාන් මාක්ෂික සර්පිෂා[1];

බර්ජූරාදි ලේහය :

බර්ජූර පිප්පලි ද්‍රාක්ෂා — සිතාලාජාඃ සමාංශිකාඃ;
මධුසර්පිර් යුතෝලේහඃ — පිත්තකාසහරඃ පරඃ;

යන ලේහ දෙක ද මෙහිලා ප්‍රයෝජනවත් ය.

සාරස ප්‍රයෝගයක් :

ශටී ග්‍රරිවේර වාහති — ශර්කරා විශ්වභෙෂජම්,
පිෂ්ටවා රසං පිබේත් ප්‍රාතඃ — සඃතං පිත්තකාසනුත්;

කැස්ස එන අවස්ථාවල දී වැල්මි, උක්සිනි, සූකිරි, තල්සූකිරි, රබඩෙසුස්, ඒලාදිචූර් යන මේවායින් එකක් කටේ දමා සපා ගිලීම යහපති.

පද්මබීජ චූර්ණය :

මධුනා පද්මබීජානාං — චූර්ණං පෙත්තික කාසනුත්,

රස බෙහෙත් :

(*i*) පිත්තකාසාන්තක රසස රක්තිකා 1 බැගින් දවසට දෙවරක් පාවිච්චි කොරස සමඟ දීම ලාභකාරී වෙයි.

(*ii*) සිංහාස්‍යාදි වටිය රක්තිකා 2 බැගින් ද්‍රාක්ෂාදිලේහය සමඟ දීම ද ප්‍රයෝජනවත් ය.

(*iii*) ශීතවීර්‍යවත් අබ්‍රක භස්මය යෝගවාහි ය; ශ්වේතාබ්‍ර භස්මය ගුණයෙන් උසස් ය. අබ්‍රභස්මය ගුංජා 4 — මාෂක 1 මාත්‍රාවෙකින් ගෙන උචිත අනුපානයෙකින් යෙදීම උසස් ගුණලාභයකට හේතු වෙයි.

(*iv*) ප්‍රවාල භස්මය මෙන් ම ප්‍රවාලපිෂ්ටිය ද පිත්ත කඵ දාහාදිය සන්සිඳවීමෙහි ශක්තිමත් ය. මේ දෙවර්ගය සව තන්ත්‍ර අයුරින් මෙන් ම වෙනත් බෙහෙතකට මිශ්‍ර කොට ද දිය හැකි ය.

---

[1] ද්‍රාක්ෂාදිලේහය කවානුබන්ධය ඇති කාසයට යෙදිය යුත්තකි. පිත්තජකාසයට යෙදිය යුත්තේ මීට වෙනුවට ඕනි හෙළිම විසිනි. ක්ෂාරපාණි මතයත් මෙය ම බව —

පිප්පලාමලකී ද්‍රාක්ෂා — බර්ජූරං ශර්කරා මධු,
ලේහෝ ‘යං සසෘතෝලීඪඃ — පිත්තක්ෂයජ කාසජිත්’

යන්නෙන් පැහැදිලි වෙයි.

පාන වර්ග :

අලුත් මීපැණි දැමූ වායක පානකය හෝ ද්‍රාක්ෂාරිෂ්ටය හෝ මෙහි දී යෙදීම ලාභාවහ ය. තනකාසවය යෙදීම අලාභයට හේතු වෙයි.

පථ්‍ය :

මධුර රසවත් පදාර්ථ, ජාංගල ප්‍රාණීන්ගේ (විශේෂයෙන් මස් කා ජීවත් වන සතුන්ගේ) මාංසයෙන් සෑදූ රස (යුෂ්), අමු, බොඩහමු (මහරතු), යව යන මේවායින් පිළියෙල කළ කැම වර්ග, මුං ආදියෙන් කළ යූෂ වර්ග, තික්ත ශාකවර්ග යන මේවා ද, කවෙට්ටු දෙවර්ගය — බටු දෙවර්ගය — මෙවන් දෙවර්ගය — වංඇපල — ඉහුරු යන මේවායේ කසාය වතුර යොදූ යකස් කළ රස[1] (මස් හොඳි) — කිරි — යූෂ[2] යන මේවා ද පිත්තකාසය පිළිබඳ පථ්‍යවර්ග යි.

කඵකාය චිකිත්සා :

යෙමිකැස්ස ඇති රෝගියා වමනයෙකින් ශෝධනය කොට කටුකරස, රූක්ෂගුණ, උෂ්ණවීර්‍ය, කඵහර කර්ම යන මේවායින් යුත් යව (බාර්ලි) ආදි ආහාර වර්ගයක් දී පසු වැ කොල්ළු, ළා රාබු අල වැනි දෙයකින් පිළියෙල කළ—යූෂයට නිප්පිලි පිටි යවකාරලුණු යන දෙවර්ගය මුසු කොට හෝ **මාංසරසයට** කටුක පදාර්ථ මුසු කොට හෝ ගෙන, එය සමඟ බත් විකක් කෑවීම මැනැවි.

පස්කොල කිර :

පංචකෝලෛඃ ශෘතං ක්ෂීරං — කඵග්නං ලඝු ශස්‍යතේ,
ශ්වාසකාසජ්වරහරං — බලවන්හ්නි වර්ධනම්;

පෞෂ්කරාදි ක්වාථය :

පෞෂ්කරං කට්ඵලං භාර්ංගී — විශ්වං කාශ්මර්‍යන්ති තන්කෘතම්,
පිබේත් ක්වාථං කඵෝද්‍රේකේ — කාසේ ශ්වාසේ ච හෘද්ග්‍රහේ;

සිංහානනා ආදි ක්වාථය :

පිත්තකාසය වෙනුවෙන් කියැවුණු මේ කෂාය කඵකාසයට ද ගුණ කාරක ය.

කණ්ටකාර්‍යාදි ක්වාථය :

කණ්ටකාර්‍යුගද්‍රාක්ෂා — වාසා[3] බර්හූරවාලකෛඃ,
සකණාගරෛඃ ක්වාථඃ — සමධුඃ කඵකාසනුත්;

පිප්පල්‍යාදි ක්වාථය :

පිප්පලි කට්ඵලං ශුණ්ඨී — ශෘංගී භාර්ගවෝෂණම්,[4]
කණ්ටකාරී කාරවිකා[5] — සින්දුවාරෝ යමානිකා;
වාසකශ් චිත්‍රකශ් චෛෂාං — කෂායං විධිවත් කෘතම්,
කඵකාස විනාශාය — පිබේන්මාක්ෂික සංයුතම්;

කාමලකාදි ක්වාථය :

කාමලකාභයා භාර්ංගී — වව්කාකණ්ණාගරෛඃ,
සාලර්ක කුණ්ඩලී[6] වාසා — සිංගී ඡින්නරුහෝෂණෛඃ;
තෝයං පීනස දුර්නාම — කාසශ්වාසාග්නිමාන්ද්‍යනුත්.

---

[1] රස — මස් හෝ මාළු හෝ යොදූ යකස් කොට පෙරා ගත් හොදි වෙසෙස රස නමි; එය මාංස රස නමි ද වෙයි.

[2] යූෂ — උඳු, මුං පරිප්පු, තක්කාලි, රාබු, පලාකොළ වැනි දෙයක් යොදූ යකස් කොට පෙරා ගත් හොදි වෙසෙස යූෂ නමි. මෙය දලි රස නමින් ද හැඳින්වේ. එළවළු වල ප්‍රධනත්වය ඇති විට එළවළු සූප් යයි කියනු ලැබේ.

[3] වාසා — මේහි දී පාවිච්චි පසහ ම ගැනීම වඩා හොඳ ය. [4] භාර්ගවෝ — හාර්ඩිගි — කෙහෙන්ද. උෂණ — මිරිස්.

[5] කාරවිකා — කාරවී — කළුදුරු. [6] අලර්ක — වැල්නිබබොටු, කුණ්ඩලී — අඟු; කළු උක්,

දශමූල ක්වාථය :

පාර්ශ්වශූලේ ජ්වරේ කාසේ — ශ්වාසේ ශ්ලේෂ්ම සමුද්භවේ.
පිප්පලි චූර්ණ සංයුක්තං — දශමූලීජලං පිබේත්;

දාරුඵලාදි ක්වාථය :

මෙය ජ්වර ප්‍රකරණයෙහි කියැවී ඇත. කාස ශ්වාස හික්කා කංඨරෝගාදිය පිළිබඳින් මහෞෂධයෙකි. මෙය චූර්ණයක් වශයෙන් ද යෙදිය හැකි ය.

ඉඟුරු ඉස්ම :

සචරසං ශෘංගවේරස්‍ය — මාක්ෂිකේණ සමන්විතම්,
පායයේච්ඡ්වාස කාසග්නං — ප්‍රතිශ්‍යාය කඵාපහම්;

වංඋපල ඉස්ම :

වායකස්වරසඃ පේයෝ — මධුයුක්තෝ හිතාශිනා,
පිත්තශ්ලේෂ්ම කෘතේ කාසේ — රක්තපිත්තේ විශේෂකඃ;

විහිතක ප්‍රයෝගය :

විහිතකං ඝෘතාභ්‍යක්තං — ගෝශකෘත්පරිවේෂ්ටිතම්,
ස්වින්නමග්නෝ හරේත් කාසං — ධ්‍රැවමාඝාවිධාරිතම්;

බුළු ලෙලිවල ගිතෙල් ගා, ගොමවලින් දවටා, ගින්නෙහි බහා උයා, කටේ දමා විකටිකා ඉස්ම ගිලිමෙන් කළු කාසය නැසෙයි.

බුළු ලෙලි අළු මීයෙන් අනා ලේහ කිරීමෙන් ද මේ ප්‍රයෝජනය ලද හැකි ය. මෙය ස්වර භෙදයට ද හොඳ ය.

උගුරේ සෙම බැඳෙන විට අරළු චතුරෙන් උගුර සේදීමට නියම කළ යුතු ය.

පිප්පලාදි ලේහය :

පිප්පලි පද්මකං[1] ද්‍රාක්ෂා — සමීජක්වං වෘහතීඵලම්.
ඝෘත ක්ෂෞද්‍ර යුතෝලේහඃ — ශ්වාසකාස නිබර්හණඃ;

මුස්තාදි ලේහය :

වම්මුතු තිප්පිලි, ඇට නැති රටමීදි, හොඳින් පැසීගිය එළබටු ගෙඩි යන මේවා සම සම ව ගෙන චූර්ණ කැර, ඒ ගිතෙල් දෙකින් අඹරා, ලේහ කිරීමෙන් සෙම් කැස්ස වැඩි යෙයි.

ආර්ද්‍රකාවලේහය :

වෛද්‍යජීවනය බලා දැන ගන්නේ ය.

කණ්ටකාර්යාවලේහය :

මෙය භාව ප්‍රකාශාදියෙහි ආයේ ය.

---

[1] පද්මක — පියුමිකාඩු: අභාවයෙහි රෝස්සදඩු හෝ කිනඅරටු ගැනේ.

හරීතකාදි ගුටිකාව :

හරීතකී නාගර මුස්ත චූර්ණං
ගුඩේන තුල්‍යං ගුටිකා විධේයා,
නිවාරයත්‍යාශූන ධාරිතෝ'යං
ශ්වාසං ප්‍රවෘද්ධං ප්‍රබලං ච කාසම්;

*මාත්‍රාව මාෂක 2 යි; ගුළිය කටේ තබාගෙන සූප්පු කිරිමෙන් තදබල ශ්වාස කාස දෙක මැඩියෙයි.

හරීතකාදි මෝදකය :

හරීතකී කණා ශුණ්ඨී — මරිච ගුඩ සංයුතම්,
කාසග්නෝ මෝදකඃ ප්‍රෝක්තඃ — තෘෂ්ණාරෝචක නාශනඃ,

රසෞෂධ :

වෘහද් රසේන්ද්‍ර ගුඩිකාව ගුංජාව බැගින් ගෙන ඉහුරු ඉස්ම සමඟ ද, කාසකුමාර රසය ගුංජාව බැගින් ගෙන පංචකෝල ක්ෂීරක්වාථය සමඟ ද, වෘහත් ශෘංගාරාභ්‍රය ගුංජා 4 බැගින් ගෙන කුරුඳු කුඩු හා මීපැණි හා සමඟ ද, ස්වර්ණභූද භෛරවය ගුංජා 2 බැගින් ගෙන මීපැණි සමඟ ද,

ශෘංගහස්ම, කෘෂ්ණාභ්‍ර භස්ම, රසසින්දූර, ටංකණ භස්ම යන මේවා තනිකර හෝ වෙනත් සහායකයක් සමඟ ද දීම ප්‍රයෝජනවත් ය.

ආසවාරිෂ්ට :

සෙම ව්‍යාධීන් අවස්ථා හි පිප්පල්‍යාසවය හා වාසාරිෂ්ටය ද, සෙම බහුල (වැඟිරෙන) අවස්ථාහි කනකාසවය ද, සාමාන්‍ය අවස්ථාහි ද්‍රාක්ෂාරිෂ්ටය ද කෑමට පසු මෙසහැදි 2 බැගින් (අවශ්‍යතාව අනුව) දිය යුතු ය.

ක්ෂතජකාස — ක්ෂයජකාස චිකිත්සා :

(*i*) ක්ෂතජකාසය නිසි පිළියම් නොලැබෙන විට ක්ෂතජයක්ෂ්මය බවට පරිණත වෙයි. එහෙයින් ඉක්මන් ප්‍රතීකාර වැඩ පිළිවෙළක් අවශ්‍ය ය. මෙහි කෙළින්ම යෙදිය යුත්තේ උරඃක්ෂතය පිළිබඳ ක්‍රියා ක්‍රමය යි. අතිරේක වශයෙන් —

(අ) මීපැණි ගිකෙල් සූකිරි මිශ්‍රණය වරින් වර දීම ද,

(ආ) පාවට්ටා යුෂින් භාවනා දුන් කුඩුක් පොතු කුඩ මීපැණි සමඟ දීම ද,

(ඇ) අමුඉහුරු සුදුලූනු[1] යන දෙවිගය කොටා, කෙහෙල් කොළයෙක හෝ පාවට්ටා කොළවල හෝ ඔතා, පුට පාක කොට, බරට බරක් කිතුල් හකුරු දමා මීපැණියෙන් අඹරා තබා නිතර ටික ටික කෑමට දීම ද,

(ඈ) සුදුලූනු කබලින් බැද බඳුනක බහා තද කැර, ඒවා වැයියන ප්‍රමාණයෙන් මීපැණි බහා තබා[2] හෝ සුදුලූනු උණු අළුවෙන් තම්බා හෝ වරින්වර කෑමට දීම[2] ද මැනවි.

(*ii*) ක්ෂයජකාසයෙහි හේතුව ක්ෂය ම ය. හේතු නිරෝධය ඵලනිරෝධයට හේතු වන හෙයින් ක්ෂය (රාජයක්ෂ්ම) රෝගයට නියමිත ප්‍රතීකාර විධිය මෙහි දී ද යෙදිය යුතු ය.

(අ) වාසාකුණ්ඩලිකා'ලර්ක කාසමර්ද නිදිග්ධිකාඃ,
කෂායඃ ක්ෂෞද්‍රසංයුක්තඃ — ක්ෂයකාසප්‍රණාශනඃ;

(ආ) මැඩහතු රත්නිවුල් දියමිනි අදුන් කැ ට
වගපුල් කසා සමහින් ගෙන වැල්මඳ ට
සුනුකොට රෙගෙන මීපැණි සමඟ එක් කොා ට
කැකලැ ක්ෂතජ කැසි-ක්ෂය කැසි නැත ඔහු ට

(*iii*) ව්‍යාඝ්‍රී හරීතකී, අඟස්ත්‍ය හරීතකී යන දෙකින් එකක් වරකට තෝලාව බැගින් ගෙන එළකිරි සමඟ ද වාසාවලේහ, ලක්ෂ්මීවිලාස, සමඟර්කර ලෙහ යන මේවා නියමිත අනුපානයක් සමඟ ද ක්ෂතජ කාස දෙක්හි ම යෙදිය හැකි ය.

---

1 අමුඉහුරු, සුදුලූනු යන දෙවර්ගය මැ උරඃක්ෂත (පෙණහලු තුවාල) වලට හොඳද, පිත්තකෝප රක්තදර්ශන දෙකට ම නොහොඳ ද වෙයි.

2 පසුවේ රිදීම, අධික රුධිර පීඩනය, පක්ෂාඝාතය, මස්තිෂ්ක සන්‍රුප්තාව (Cerebral Thrombosis) මස්තිෂ්ක රක්තස්‍රාවය (Cerebral Haemorrhage යන මේවාහි ද මේ රසෞෂධ ප්‍රයෝගය ලාභදයක ය. පිත්කැසි ලේකැසි දෙකට අයෝග්‍ය ය.

විවිධ කාසරෝග — චිකිත්සා

(අ) කුක්කුර (කාල) කාසය :

කක්කල් කැස්ස යනු සිංහල ව්‍යවහාරය යි. රෝග බීජයෙක[2] ආක්‍රමණයෙන් බෙහෙවින් ම කුඩාවුන් කෙරෙහි පැන නැහෙන මේ රෝගය ලක්ෂණ විසින් වාතකාසයට සමාන ය. වාතකාසයෙහි බෝවීමක් නැත. සියලු ම කාස යන්හි වාතකෝපය අධිකතම ව දැක්ක හැක්ක. මේ රෝගය අතදරුවනට මාරකයෙකි. ළමයින්ට ඊට වඩා ටිකක් ද අවුරුදු 7 — 10 හරියේ ලොකු ළමයින්ට ඊටත් වඩා ටිකක් ද සැර අඩුව පැන නැහේ. ආශ්වාසයට ඉඩ නො තබා දීර්ඝ අත්දමින් දුෂ්කර නිඃශ්වාසයකට රෝගියා යොමු කොට ලන ආකාරය, ආකාරුණික කෙනෙකුට වුව ද බලාසිටිය නොහැකි තරම් බෙදා ජනක ය. කැස්ස උග්‍ර වනුයේ රාත්‍රීකාලයේ ය. එහෙයින් මේ කැස්ස ආවේගි ගණයෙහි ගැනේ. මේ රෝගය පවතිද්දී ශ්වාසනාල ප්‍රදාහය[3] මෙන් ම ශ්වාසනකප්චරය[4] ද පැන නැඟිය හැකි බව මෙහි දී අමතක නොකළ යුතු ය.

චිකිත්සා :

ක්වාථ :

(*i*) මධුකං වාහකී වාසා — චිත්‍රහංඛාලතා ඛනා,
නාගරං චේති නිර්යූහඃ — ශිශෝඃ කුක්කුරකාසනුත්;

(*ii*) කණ්ටකාරිජටා ධාන්‍යං — යෂ්ටි කර්පූරවල්ලරී,
ක්වාථඃ කුක්කුරකාසඝ්නඃ — සිතාමාක්ෂික සංයුතඃ;

ලේහ :

(*i*) කර්පූරවල්ලිං වාසායාඃ — පංචාංගං වාර්ද්‍රකං භිපක්,
පචේත් කන්දුකයන්ත්‍රේණ — හරේත් සම්පීඩ්‍ය තද්රසම්;
සිතාමධුයුතං ලිහ්‍යාච් — ඡිශෝඃ කුක්කුර කාසනුත්ඃ;

(*ii*) කර්පූරවල්ලි- වඡ්‍රාංගී — ගාංජනඤ්ච සමං හරේත්,
රසමේෂාං පචේත් පාත්‍රෙ — ප්‍රසථමාත්‍රං යථායථම්,
කාලේ ශරාවං බංඩ්‍ය — දද්‍යාත් ඒණිතතාං නයේත්,
ලේහයේත් මාත්‍රයා කාසඃ — කුක්කුරෝ භාණිමෘච්ඡති;

පැණි :

(*i*) කප්පරවල්ලිය ඉස්ම බෝතල 5 යි, හිරිස්සපලු ඉස්ම බෝතල 3 යි, රතුලූනු ඉස්ම බෝතල 2 යි, කළුදුරු පිටි කලන් $7\frac{1}{2}$ යි; මේ යෝගය පැණි පදමට කකාරා ගන්නේ ය. සියලු ම කැසිවලට ගුණකාරක වන මේ ලේහය මෙයට උඩින් කියැවුණු ලේහය සමඟ සසඳා බලන්නේ ය.

(*ii*) කළු උක්දඬු, අමුවදකහ, අමුඉහුරු යන මේවා සම සම ව ගෙන කොටා ඉස්ම ගෙන පැණි පදමට එන තුරු හැදි ගාමින් උයා, බීමට බා, නිවීගියාට පසු බෙහෙතින් අඩකට සම වන සේ මීපැණි දමා අනා තබා, තේ හැඳි 1 බැගින් වරින් වර දෙනු. සෙසු කැසිවලට ද දිය හැකි ය.

ධූම්කොළ අළු :

ධූම්කොළ කැබලි කොට අන්තර්ධූම පිඩියෙන් දවා, ගංජා $\frac{1}{4}$ බැගින් උදයේ පොවනු. වියළි සෙම බුරුල් වී වමනය වෙයි.

පිටි :

බැද පිටි කොට ගත් පෙරුංකායම් මෙන් ම සීනක්කාරම් ද කක්කල් කැස්සට ඉතා හොඳ ය. අවස්ථා ආදිය අනුව නිසි මාත්‍රාවෙන් ප්‍රයෝග කළ යුතු ය.

---

[1] Whooping — Cough, Hooping — Cough, Pertussis, Chin — Cough. [2] Haemophilus Rertrssis.
Bronchitis. [4] Pneumonia.

ආලේප :

කෝලය්ලේෂ්මා තෛලය, බටුතෙල, නිර්ගුණ්ඩ්‍යාදි තෛලය යන මේවායින් එක් වර්ගයක් ගෙන, පපුවේ ආලේප කොට උඩු අතට අත ගැම්ම හොඳ ය. බුලක් කොළ, ගම්මිරිස් කොළ, වරාකොළ යන මේවායින් එක් වර්ගයක් ගෙන රත් කැර කැවීම ද මැනවි.

(අ) වියළි කැස්සට :

පැණියක් :

වැල්මී තෝලා 03 යි, තල්සූකිරි තෝලා 03 යි,
වල්ගාමිරිස් තෝලා ½ යි, ඇටනැති රටම්දි තෝලා 02 යි.

චතුර පත 4 — 2 සිඳුවා පෙරා තබා, වරින් වර දෙනු. කැස්ස මැඩේ. දවස මුළුල්ලේම පවන් ගහන්නාක් බඳු සුවයක් දනේ.

ද්‍රාක්ෂාභයාඔලක තාඹලක යනාදි කෂාය ද මෙහිලා ගුණකාරක වෙයි.

(ආ) අකීකරු කැස්සට :

කුගාදි චූර්ණය :

උණකපුරු තෝලා 04 යි, තිප්පිලි තෝලා 02 යි,
මහඑන්සාල් තෝලා 02යි, හින් කුරුඳු පොකු තෝලා ½ යි,
මේවා ධූණී කැර, ඊට සමාන වන මාත්‍රාවක් සූකිරිකුඩු දමා කලවම් කැර තබා, උචිත මාත්‍රාවෙකින් යොදනු. කැස්ස නැසේ. මෙය දරුණු වියළි කැස්සට එළකිරි සමග ද දිය හැකි ය.

(ඇ) රුධිර කෝපයෙන් යුත් කැස්සට :

1. චන්ද්‍රාමෘත රසය වැල්මී නිල්මානිල් අල යන දෙවගය නැමිබු චතුරින් දෙනු.
2. අමු ඉහුරු වැල්මී කසාය තල්සූකිරි සමඟ දීම ද,
3. නාලිසාදිය කලන් 2 කට තල්සූකිරි (තාලගර්කරා) පලමක් දමා අඹරා පමණ බලා දීම ද මැනවි.

(ඈ) ප්‍රතිශ්‍යාප්වර ආදියෙන් වන කැස්සට :

වැල්මී, රටම්දි, රටඉඳි, කිතුල් හකුරු, සුදුලූනු ආදි සන්තර්පණ දේ යෙදිය යුතු ය. කවුක දේ අපතර්පණ කළිය සිදු කරන හෙයින් මෙහි ලා අයෝග්‍ය වෙයි. ඒලාදි මෝදකය මෙන් ම මධුශර්කරා ද මෙහි දී හොඳින් ක්‍රියා කරයි.

වැල් මී, තිප්පිලි, රටඉඳි, රටම්දි යන මේවා සම සමව ගෙන කොටා, මීපැණියෙන් අඹරා තබා, වේක වේක විටින් විට කෑමට දෙනු. කැස්ස නැසේ.

(ඉ) නොඉවසිය හැකි කැස්සට පානකයක් :

වැල්මී, සූකිරි, අසමොදා, අමු ඉහුරු — කලන් 3 බැගින් ද,
එසේම — කුරුඳු, සාදික්කා, වසාවාසි — මංවාඩි 5 බැගින් ද,
සුදුලූනු බීජ 10 ක් ද,

යන මේ සියල්ල සමඟ දෙහිගෙඩි දෙකෙක පැගිරි සහිත ලෙලි ද ගෙන, තළා, බදුනෙක බහා, චතුර බෝතල 2 — 1 ට සිදුවා පෙරා, නිවීගියාට පසු මීපැණි අවුන්ස භයක් දමා සොලවා තබා, තදබල කැස්සට මෙස හැදි 1 බැගින් චරින් වර දිය යුතු ය. පපුවේ පීඩාවට ද මැනවි.

(ii) පිප්පලාදි ලේහය :

පිප්පලිමරිච ද්‍රාක්ෂා -- ශර්කරාක්ෂීරඝෘතිමම,
සක්ෂෞද්‍ර මාතුලුංගාම්ලං — වේති සර්ං විමර්දයේත්;
මාත්‍රයෝචිතයා ලිහ්‍යාද් — චාරං චාරමහර්නිශම්,
කාසශ්වාසාරුචිච්ඡර්දී -- හරෝ ලේහෝ මහාබලඃ;

(iii) චන්ද්‍රාමෘත රසය :

වාසාගුඩූචී භාර්ංගී ච — ඉුස්නකං කණ්ටකාරිකා,
තුලාඃංශෛරාහිතඃ ක්වාථඃ -- කාසක්ෂය විමර්දනඃ;

යන ක්වාථය සමග ප්‍රයෝග කරනු.

(ද) ඇදුම සහිත කැස්සට :

භාර්ංගී සනාගරා සිංහි යනාදි කෂාය මෙන් ම අමෘතානාගර එංජී යනාදි කෂාය ද දිය හැකි ය.

(ධ) අතිරික්ත ආකුංචනය[1] :

පරිචය :

ස්වාභාවික ධමනි ස්පන්දන (නාඩි) සංඛ්‍යාව දහයකින් හෝ දොළහකින් (පමණ) අඩු වේ. අයික විවේකයේදී ස්පන්දනය ක්‍රමානුකූලව පැවැති වැඩියෙන් වරක් සැලේ. මානසික බල පෑම මෙහි ප්‍රධාන හේතුව වශයෙන් සැලකේ. මත්පැන් බීම, දුම්බීම, දුම්කොළ සැපීම, වැඩි වැඩියෙන් තේ කෝපි බීම යන මේවා ද මෙයට හේතු වනු ඇත. මේ තත්වය ඇති අය වැඩිවශයෙන් මිය යනුයේ නින්දේදී ය. නාඩි ස්පන්දනය ගිදුවනුයේ වාර තුන හතරකට පසු එකක් ඇන හිටීමෙනි. එය සවිරාම ස්පන්දනයෙකි. හෘදය ස්පන්දනයේ මේ තාවකාලික ක්ෂණික නිවෘත්තිය අතිරික්ත ආකුංචන නමින් හැඳින් වේ. රෝගියා නැගිට අත්පා හොලවා ක්‍රියාවෙහි ලා පේශීන් පෙළඹවූවිට මේ රෝගි තත්වය තාවකාලිකව ඉවත් වනු ඇත.

ආඝණනයේ දී ද මේ තත්වය තේරුම්ගත හැකි ය. කුඹුක්පොතු, බක්මීපොතු, කිරිහසාය, කුඹුක්, බැබිල සුළුපහ කිරිකසාය, අර්ජුන ඝෘතය යන මේවා මෙහි ලා ඉතා හොඳ ය.

ශ්වසන ව්‍යූහය කෙරෙහි ද මේ අතිරික්ත ආකුංචනය බලපායි. එවිට ද කාසය පැන නැගේ. එහි ඇත්තේ සෙමින් තොර වියළි කැස්සකි. එහි ලා ද්‍රාක්ෂා වාසා ඇතුළත් යෝග හොඳින් ක්‍රියා කරයි. වාසාඝරස භාවිත අර්ජුන වල්කල චූර්ණය ද මෙහි යෙදීම ලාභප්‍රද ය. ගිතෙල්, මීපැණි, සූකිරි සංයෝගය හෘද්රෝගය සමඟ එන කසායට මෙන් ම ක්ෂතජ කාසවලට ද අභිශයින් ප්‍රශස්ත ය. සමශර්කර චූර්ණය ද මෙහි ලා විශිෂ්ට ගුණයක් දක්වනු ඇත.

(ඌ) සාධාරණ කාස චිකිත්සා :

ක්වාථ වර්ග :

කණ්ටකාරිකෘතඃ ක්වාථඃ — යකෘච්ඡූඃ සවීකාසනුත්,
පිප්පලී චූර්ණ සංයුක්තෝ — දශමූලික්වථෝ යථා;

දශමූලස්‍ය චා ක්වාථඃ — පෙෂ්කරේණාවචූර්ණිතඃ,
කාසශ්වාස ප්‍රශමනඃ -- පාර්ශ්වශූල නිවාරණඃ;

ක්ෂුද්‍රා සිංහමුඛීශුංඨී — කුලත්ථෛරාහිතඃ ක්වථඃ,
පීතඃ පුෂ්කර චූර්ණාඪ්‍යඃ — කාසශ්වාසාර්තිමුද්ධරේත්,

---

[1] Extra Systole -- අතිරික්ත ස්පන්දනය.

පාඨාභාර්ංගි නාගරං දේවකාෂ්ඨං
වාසාමූර්වා කුණ්ඩලී කණ්ටකාරී,
ආසාං ක්වාථඃ පිප්පලීචූර්ණ යුක්තඃ
කාසං ශ්වාසං චෝර්ධ්වවාතං නිහන්ති,

දශමූලීශටී රාස්නා — පිප්පලී විශව පෞෂ්කරෛඃ,
ශාංගී කාමලකී භාර්ංගී — ගුඩූචීනාගරාග්නිභිඃ,
යවාගූං විධිනා සිද්ධාං — කෂායං වා පිබේන්නරඃ,
ශ්වාසහෘද්ග්‍රහ පාර්ශ්වාර්ති — හික්කා කාය ප්‍රශාන්තයේ;

පිඩුමන්දෝ වරා චෝෂං — මධුකං වෘහතීද්වයම්,
සමසූරදලං ක්වාථඃ — සහෘතෝ ජ්වරකාසජිත්,

භාර්ංගී නිදිග්ධිකා ක්වාථඃ — කණාමාක්ෂික සංයුතඃ,
පීතඃ පංචවිධං කාසං — ශ්වාසං වාඝු නියච්ඡති,

ව්‍යාඝ්‍රී වාසා වෘශ්චිකාලි ගුඩූචී —
භාර්ංගී ශුණ්ඨී කුණ්ඩලී කාසමර්ෙදඃ,
ක්වාථඃ පීතඃ ක්ෂෞද්‍ර කෘෂ්ණා සමේතඃ —
පංචශ්වාසාං පංචකාං ච හන්‍යාත්,

සිංගී වෘෂානාගරකා'භයානාං —
ක්වාථං පිබේත් පුෂ්පරස ප්‍රගාඪම්,
කඵප්‍රසේක ශ්වසනා'ග්නිමාන්ද්‍ය —
කාසප්‍රතිශ්‍යාය ගලාමයේෂු;

නිර්ගුණ්ඩී කුණ්ඩලී පථ්‍යා — ධමීපත්තන සම්භවඃ,
ක්වාථෝ ලවණ සම්මිශ්‍රඃ — කාසශ්වාස විනාශනඃ,

අමෘතා නාගරං එංජී — ව්‍යාඝ්‍රී වාසා ච තත්කෘතඃ,
ක්වාථඃ සපිප්පලී චූර්ණඃ — කාසශ්වාසනිෂූදනඃ;

භාර්ංගී කුලත්ථිකා සිංගී — ශුණ්ඨී මූලකජං ජලම්,
පිප්පලීචූර්ණ සංයුක්තං — කාසශ්වාසහරං පරම්,

ප්‍රාණද වරිව හෘංග දලේන —
සාධිතාම්බු කයන ශ්වසනග්නම්,
පාර්ශ්වශූල ශිබීමාර්දව හික්කා —
පාණ්ඩුරෝග හෘදයාර්තිහරඤ්ච,

කටුත්‍රයී පද්මක දේවදරු — රාස්නා විඩංග ත්‍රිඵලා බලානාම්,
ක්වාථෝ ජයේච්ඡ්වාස සමේත කාසං — හිධ්මාචිබද්ධං හෘදයාමයඤ්ච;

වෙදරාළගෙ මෝඩ මරා ඉසේ කේස උදුරා ගෙන
නාස බෙල්ල දෙක ම කපා පිටේ හමත් ගලවා ගෙන
දැනැ දෙපයැ ඇහලි කපා රිවිපුට දී වියළා ගෙන
දෙපලම් — අට එකට පෙරා මී සහ දුන කාස නැ සෙන

කටුවැල් බටු ඉහුරු රසකිඳ වං ඇප ල
බෙලිමුල් අරළු අවිනෙක සිඳ පෙවූ ප ල
බිවුකල් කය සෙ වද ඔසු අරළු උණු ජ ල
එමකල් නැසේ පස්විද කැස්ස තදබ ල

වෙරට මිරිසුන් අරුළු රසකිඳ වැලුන් සම යේ ගෙන කි ර
දියට ලා විදි විසින් පිසගත් කසාය ද ගනිමින් පෙ ර
ඵයට දිය කැර අරුළු කල්කය බීවොත් උදයේ නොම හැ ර
යනට පැමිණෙන සියලු කැසි ගුණ වේ යැ දුනගත් තිරය ර

කටුවැල් බටු තිකුළු අරුළුන් ගෙන ගුව ද
මෙසියල් සිසු පැන මී මුසු ව දුන් ස ද
ගෙල්බිල් රෝග කැසිමුස කෙළ ඉනීම ද
එමකල් නැයි කුසගින්න ද වේවි ත ද

තිකුළු තුන්පල නෙද කොටුමුල සිංහි දම්දෙවිසුදු ගෙ න
සියලු ඔසු පලමක් කිරාගෙන සිඳ දුනොත් මී සමඟ න
නැතිලු ඉන් මතු කාස අරුචි ද පිපාස ද මුස දුවටෙ න
අරුළු ඕහඔසු ලසුනු අහුමුල් සුන්න උණුපැන බීවු මෙ න

දසමුල් රුන්න දම්දෙවිසුදු බෙලි සිරි ල
වගපුල් කිඳි මිරිස් තිම්නෙල්ලි නෙළුඩ ල
සුගිමල් කහුළු සුඟු සම කොට සිඳපු ජ ල
හැමකල් නසයි කැසි මුස ඇළ රිදුම් බ ල

දම්දෙවි සුදු වමැපල කිඳි අතිවිඩයම් කලාඳුරු ද
වැල්තිබ්බොටු කකුළුසුඟු ද පස්කොල බටුමුල් අරුළු ද
දිය අටෙකට සිඳුවා තිප්පිලි මිරිසුන් වළඟ ගද ද
පහිවාපය කොට දුන හොත් සියලු ම කැසි යෙයි වල් වැ ද

කිපල් කොනඹුරු හෙවුසඳ දියමින්න අටරුසක ගෙ න
සියල් විදි ලෙස සිඳපු පැන මීපැණි හෙළා කාසෙට දෙ න
එමුල් එළබටු කකුළුසුඟු අසමොද ද මහඹුසු ඇරගෙ න
කුහුල් නො වැ කළුදුරු යවිදලුණු ගිනෙල් මීයෙන් වළඳ න

එඩරු තිකුළු දම්දෙවි සුදු ද සමඟි න
සොඳුරු කංටකාරීමුල් සම ව ගෙ න
චතුරු අටින් එකකට සිඳ පෙවූ තැ න
නපුරු සියලු කැසිමුස යෙයි ගතිනි පැ න

වමැපල ඉහුරු දම්දෙවි සුදු කොනඹුරු ද
කහ අල පැනිතුටර තිප්පිලි ද රසකි ද
මෙසකල ඔසු ම කිරමින් රැගෙන හිසි ලෙ ද
සිඳි ජල දුහොත් කැසිමුස බල යේ යැ බී ද

බැඹිල දෙබටු මිදිපල වංඇපල මු ල
සිලිල අටපතෙක ලා එකට ආ ක ල
විමල බවට පත් කොට පොවනු කැර ලො ල
සකල කාස උණ හැර යේ යැ නො පැනි ල

ඇන්දෙමට මුල් ඉහුරු තිප්පිලි පොකුරු මුල් දම්දෙවි සුදු න්
ගත් ඔසුව මේ සියලු ඔසු සම ලෙස කිරා සිඳි පැන පස න්
පත් ගතට සැම නපුරු කැසිමුස සොඳට සුව වෙයි දෙනු යලි න්
ගත් පැනට මුල් එවැල් තිබ්බොටු මිරිය් සිඳ ගැම් කැසි නයි න්

මුල කටුවැල් බටු වැල් තිබ්බොටු දෙකි න
වැල රසකිඳ කුවර ද වනැපල මූලි න
නොලස ව සිඳ රුගත් පැන ගෙන පෙවූ තැ න
බලකර කැසිමුස ද සය උණ යේ ය පැ න

වම්මුතු අමු ඉහුරු බෙලිමුල් ද අරළු ද
තුන්කුළු මෙහැම ගෙන සිදි දිය පෙවූ ස ද
පැන් ගෙන දෙබටු තම්බාලා පෙවූ ලෙ ද
සුන් වී යෙයි සියලු කැසිමුස බිඳී ඔ ද

බැබිලත් සොකුරුමුල් තුන්කුළු ද සුරද ර
තිපලත් වළහසාලුත් රත්ත උණු කැ ර
අරගත් විමල් ඔසුදිය බොන්ට දුන්ව ර
බලවත් කාස හික්කා යෙයි සිරුර හැ ර

උක්දඬු පුසුල් දඬු රටමීදි සදුන් හ ර
එක්කැර ඇඹුලු රසකිද දෙබටු ද ඉහු ර
දක්වා එකක් සිදගත් දිය පෙවූ ව ර
ඉක්මන් වේවී කැසිමුස යෑම ගත හැ ර

වම්මුතු රටතෝර දියමීනි අමු ඉහු රු
හම්පොතු අරළුගෙඩියෙහි යන හැම සොදු රු
අම් අටිනෙකට සිදගෙන බිව හොත් දෙව රු
සොම්නස ළහා වෙයි දුරු වී කැසි නපු රු

වූර්ණ වර්ගය

බැබිලත් රත්ත දෙවිදර සහ තිපල් ගෙ න
තිකුළුත් වළහසාලුත් නෙළුඹුඵල ගෙ න
සකුරුත් සමහ පොඩි කරමින් අනා ගෙ න
කැවහොත් කැසිපස ම නැත - දෙනු බලා ගෙ න

එකක් අරළු මිරිසැට දහයක් රැගෙ න
සුනු කොට උණුදියෙන් රැදින පෙවීමේ න
නිදින් දුරර පිඩා දෙන කැසි යෙහෙ න
නමත් නැති ව යෙයි දූනගන් නියතයෙ න

පද්‍ය :

කොහිල සිහින් ගෙඳ හෙළබටු අළු කෙහෙ ල
ගිතෙල පරණ මීගමය හා ළාපුසු ල
ලුහුල ඇ මාළු හාමස යන සිය ල
සකල කාසයට පත්තිය බොජුන් බ ල